ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 8.13.4

# කොන්ත්‍රාත් විචලනයන්

ක්‍රියාත්මක කිරීමේ අදියරේදී ඇතිවන කොන්ත්‍රාත් විචලනයන් හේතු කොට ගෙන ප්‍රසම්පාදන අස්ථිත්වය සහ රජය මත සුවිශාල බරක් පැටවෙයි. අවසාන කොන්ත්‍රාත්තු මිලට / මුදලට විචලනයන්ගේ දායකත්වය අධික වේ නම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී සිදු කල ප්‍රසම්පාදන ක්‍රියාවලිය දියාරුවී යනු ඇත.

එබැවින් මෙම තත්වය අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සෑම වෘත්තීයමය ප්‍රයත්නයන් දරනු ලබන බවට වග බලා ගත යුතුය. විචලනයන් ඇතිවීමට මූලික වනුයේ විෂය පථය වෙනස්වීම්, ප්‍රමාණයේ අඩුවැඩිවීම් සහ මගහැරීම් වේ. ප්‍රමාණ බිල්පත් සැකසීමේ නියුතු සියළුම වෘත්තිකයන් විසින් ප්‍රමාණ බිල්පත්වල සඳහන් ප්‍රමාණයන් හැකිතාක් දුරට නිවැරදි බව තහවුරු කල යුතු අතර එම බිල්පත්වල සඳහන් ප්‍රමාණයන් වැටයීම සඳහා 5%කට වඩා ඉඩ නොදිය යුතුය. නියමිත පරිපාටිය අනුගමනය කරමින් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්තු මිළ ගණන් ඉහල යාමට හේතුපාදක වන විෂය පථය වෙනස්වීම මත නිකුත් කරන විචලන නියෝග නිකුත් නොකල යුතුය. කෙසේ වුවද අනුමත කිරීමේ පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව මුල් ප්‍රමාණ බිල්පතෙහි සඳහන් ප්‍රමාණාත්මක අගයන් අඩුවීම සහ /හෝ අයිතමයන් ඉවත් කිරීම හේතුවෙන් අත්වන ඉතිරිකිරීම්, විචලන නියෝග නිකුත් කිරීම සඳහා භාවිතා කල හැකිය. විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන විචලනයන් අවම කිරීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලංසු කැඳවීමට ප්‍රථම සැලසුම් සම්පාදනයෙහි නිරත පුද්ගලයන්ගෙන් ඔවුන් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය හෝ බාහිර උපදේශකයන් වුවද, සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබා ගත යුතුවෙයි. මෙය ක්‍රියාත්මක කිරීමේ අදියර තුල සිදුවන විෂය පථය වෙනස්වීම අවම කිරීම සඳහා මෙය අවශ්‍ය වේ.

**ප්‍රමාණාත්මක වෙනස්වීම් / අත්හැරීම් හේතුවෙන් සිදුවන විචලනා අවම කිරීම සඳහා**

i. ලංසු ලියකියවිලි පිළියෙල කිරීමට ප්‍රථම ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රමාණ බිල්පත් සකස් කරන ලද පාර්ශ්වය වෙතින් එම ප්‍රමාණ බිල්පත්වල නිවැරදිභාවය හා සම්පූර්ණභාවය දෙවන පාර්ශ්වයක් විසින් පරීක්ෂා කල බවට සහතිකයක් ලබා ගත යුතුයි.

ii. සමාන ආකෘති හෝ ගොඩනැගිලි ඉදි කරන විට වර්තමාන / නව ප්‍රමාණ බිල්පත් තීරණය කිරීමට ප්‍රථම එවැනි සමානුරූපී ආකෘති හෝ ගොඩනැගිලි සඳහා කලින් පිළියෙල කරන ලද අවසාන මිනුම් හා ප්‍රමාණයන් සමඟ සැසඳිය යුතුය.

iii. ප්‍රමාණ බිල්පත්වල නිරවද්‍යතාවය වැඩිකර ගැනීම සඳහා වෙනත් ඕනෑම සුදුසු පියවරයන් භාවිතා කරන්න

කොන්ත්‍රාත් විචලනයන් සඳහා අනුමත කිරීමේ අධිකාරය

A <u>කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ මිලෙහි 10% සීමාව තුළ ශුද්ධ විචලනයන්</u>

අවශ්‍යවන්නේ නම් පහත සඳහන් ක්‍රියා මාර්ගයන්ට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂකට මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමෙන් විචලනාවය අනුමත කල හැකිය.

(a) අදාල පාර්ශවයන් වෙතින් පැහැදිලිකිරීම් සටහනක් ලබා ගැනීම මගින්

(b) පහත දැ සම්පූර්ණ කිරීම මගින්

i කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල අවස්ථාවේ අපේක්ෂා නොකල කරුණු නිසා විෂය පථය වෙනස්වීම
Ii විෂය පථය වෙනස්වීම සාධාරණීකරණය කළහැකි බව
iii ප්‍රමාණාත්මක විචලනය / විචලනයන් ආන්තික හෝ අනපේක්ෂිත අවස්ථා මත සිදු වූ විට

එසේ නොමැති නම්

(c) පහත B හි සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින්

B <u>ශුද්ධ විචලනයන් කොන්ත්‍රාත් ප්‍රදාන මිලෙන් 10% සීමාව ඉක්මවීම</u>

(a) දෙපාර්තමේන්තු ප්‍රධානියා / ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉහත (a ) සහ (b ) අනුකූලව සකස් කල ප්‍රකාශනයක් සමඟ අදාල සියළු ලියකියවිලි ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ඉදිරිපත් කල යුතුය.දෙපාර්තමේන්තු ප්‍රධානියා / ව්‍යාපෘති අධ්‍යක්ෂ මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට අදාල සියළු ලියකියවිලිද ඉදිරිපත් කල යුතුය.

(b) විචලනය කොන්ත්‍රාත්තු පිරිනැමීමේ මිලෙහි 15% සීමාව තුල නම් සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ප්‍රකාශන සමඟ සෑහීමකට පත්වන්නේ නම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් එය අනුමත කළ හැකිය.

(c ) ශුද්ධ විචලනය කොන්ත්‍රාත්තු පිරිනැමීමේ මිලට වඩා 15% කට වඩා වැඩි වූ විට හෝ ශුද්ධ විචලනය 15% කට වඩා අඩු වූ විට සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ප්‍රකාශන සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා එකඟ නොවන්නේ නම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් එය තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහාය ලබන අදාල ප්‍රසම්පාදන කමිටුවට යොමු කළ යුතුය.මෙම අවස්ථාවේදී අදාල ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ යුත්තේ කොන්ත්‍රාත් මිල වැඩිවීමේ අගයට වන අතර සංශෝධිත කොන්ත්‍රාත් මිලට අදාල ප්‍රසම්පාදන කමිටුවට යොමු කිරීම අවශ්‍ය වන්නේ නැත.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 8.13.4

# කොන්ත්‍රාත් විචලනයන්

විචලනයන්ගේ සාමාන්‍ය ප්‍රමාණය (ප්‍රමාණ වෙනස්වීම් සහ නිකුත් කරන ලද අතිරේක වැඩ නියෝග එකතුව හේතුවෙන් ) (10%ක උපරිමයක් විය යුතු) හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්ම වන්නේ නම් එබඳු විචලන නියෝග නිකුත් කිරීමට පෙර ප්‍ර.ගි.නි.ගෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් අනුමැතිය ලබාගත යුතුය. පහත දැක්වෙන ආකෘතිය දෙපාර්තමේන්තු ප්‍රධානියා/ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් භාවිතා කළ හැකිය.

| | | |
|---|---|---|
| 1. මුල් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ වටිනාකම | | රු: |
| 2. මුල් කොන්ත්‍රාත් මිළ | | රු: |
| 3. මු.පි.ඇ. සම්පාදිත හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ප්‍රතිශතය | | |
| 4. මේ දක්වා විචලන සාමාන්‍යය (ප්‍රමාණවල වෙනස්කම් ඇතුළුව) | | |
| | | මුදල |
| මුල් කොන්ත්‍රාත් මිලෙන් ප්‍රතිශතය | | |
| 5. ප්‍රවර්තන විචලනය / විචලනයන් සඳහා හේතුව/හේතූන් කුමක්ද/මොනවාද? (උචිත පරිදි එකක් හෝ දෙකම ලකුණු කරන්න) | | |
| | පහත සලකුණු කරන්න | මුදල් ප්‍රමාණය / න් |
| ප්‍රමාණ බිල්පත්වල ප්‍රමාණයන්හි දෝෂ | | රු: |
| විෂය පථය වෙනස්වීම | | රු: |
| අනු එකතුව | | රු: |
| මේ දක්වා නිකුත් කළ විචලනයන් (ඉහත 4 න්) | | රු: |
| ප්‍රවර්තන විචලනයන් සමඟ සාමාන්‍යය | | රු: |
| මුල් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ සාමාන්‍ය ප්‍රමාණයෙන් ප්‍රතිශතය | | |

| | |
|---|---|
| සටහන | ඉහත ගණන් බලා ඇති ආකාරයට සාමාන්‍ය ගණන මුල් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ මුදලින් 5% සීමාවේ පවතී නම්, ප්‍ර.ගි.නි. විචලනය ගැන සෑහීමකට පත් වේ නම් ඔහු විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක සහාය ලබමින් විචලනය ඔහු විසින් අනුමත කළ හැකිය.<br><br>ඉහත ගණන් බලා ඇති ආකාරයට සාමාන්‍ය ගණන මුල් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ මුදලින් 5%ට වැඩි හෝ සමාන හෝ වේ නම් සහ ප්‍ර.ගි.නි. විචලනය ගැන සෑහීමකට පත් වේ නම්, විචලනය අදාල ප්‍රසම්පාදන කමිටුව විසින් යෝග්‍ය තාක්ෂණික ඇගයීම් කමිටුව සහාය ඇතිව අනුමත කළ හැකිය. මෙම කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රතිශෝධනයේ පදනම යෝග්‍ය ප්‍රසම්පාදන කමිටු විසින් තීරණයක් ගත යුතු අතර , එම ප්‍රසම්පාදන කමිටු මුල් ප්‍රසම්පාදනය ගැන කටයුතු කළ කමිටුව වීම අවශ්‍ය නොවේ. |

6. ප්‍රවර්තන විචලනය/විචලනයන් ප්‍රමාණ බිල්පතේ වරදකින් සිදුවී තිබේ නම් , මුල් ප්‍රමාණ බිල්පත් සකස් කළ වගකිවයුතු නිළධාරියාගෙන් ලබා ගත් කරුණු පැහැදිලි කිරීම : ( ඇමුණුම් සපයන්න)

7. විෂය පථයෙහි වෙනස ප්‍රවර්තන විචලනයට/විචලනවලට හේතුව නම් නිර්මාණය කෙරෙන අවදියේදී ප්‍රසම්පාදන අස්ථිත්වය එය නුදුටුවේ මන්දැයි යන්න ගැන ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් ලබා ගත් කරුනු පැහැදිලි කිරීම : ( ඇමුණුම් සපයන්න)

| | |
|---|---|
| අත්සන | දිනය |